# කාර් සහ නොම්බර

ඔන්න අපිට එක්තරා කාලයක සිදු වුනා සෙකන්ඩ් හෑන්ඩ් පොඩි කාර් එකක් ගන්න. පත්තරෙන් බලලා කාර් හෙව්වා. හැම තැනම බැලුවා. ඔහොම යනකොට සේල් එකක මෙන්න තියෙනවා ලස්සන රතු පාට පොඩි කාර් එකක්. ගානත් සාපේක්ෂව අඩුයි. ඉතින් එන්ජිම ද අරකද මේකද සේරම බලලා අපි තීරණය කළා ඒක ගන්න.

" අපි එහෙනම් වැඩේ කරමු ඇඩ්වාන්ස් එකක් දෙන්නම්. හෙට ඉතිරි මුදල් අරන් ඇවිත් කාර් එක ගෙනියන්නම්" අපි එහෙම කිව්වෙ කාර් එකේ හොද තත්වයට සාපේක්ෂව ගාන ටිකක් අඩු නිසා මෙතන අපි නොදන්න දෙයක් තියෙනවද සැකයකුත් ඇතිව.

" මහත්තයල එන්නකො පොඩ්ඩක් ඇතුළට" . සේල් හිමියා අපව ඇතුළට කැදවලා වාඩි වෙන්න සැලැස්සුවා. ' මොකක් නමුත් කියන්නයි යන්නෙ. අයියෝ මේකත් එහෙනම් ගන්න වෙන්නෙ නෑ" කාර් හෙවිල්ල එපා වෙලා සිටිය මම හිතෙන් හිතුව.

" නම්බර් එක බැලුවෙ නෑ නේද?" සේල් හිමියා විමසුවා.
" නම්බර් එක?"
අපට ගැටලුවකි.

"මේක 13 ශ්‍රී කාරෙකක්. සේරම අංක ටික එකට එකතු කළාමත් එන්නෙ 13"
අපිද හිතෙන් ගනන එකතු කර බැලුවා
" මම කලින්ම කිව්වෙ පස්සට ප්‍රශ්නයක් වුනොත් අපට හොද නෑනෙ ඒකයි. "
එයට සිනා සී, දැනුවත් කිරීම ගැන ස්තූති කළ අපි එදින ඇඩ්වාන්ස් දී පැමිණ පහුවෙනිදාම කාරය අරන් ගියා.
පන්සල් පල්ලි කෝවිල් බාර හාර කිසිත් නැතිව අපේ පොඩි කාරය වසර කීපයක් අපට කිසිම කරදරයක් නැතිව උපරිම සේවය ලබා දුන්නා.

දැන් අපට වෙනත් කාරයක් ගැනීමට මෙය විකිණීමට අවශ්‍ය වුණා.
පත්තරේ දැම්මා.
වැල නොකැඩී කෝල්..

' හෙලෝ දැන්වීමට කතා කරන්නෙ . මට කාර් එක ගැන ටිකක් කියන්න'

'කී වෙනි ඕනර්ද, එන්ජින් කැපෑසිටි , ගිහින් තියෙන කිලෝ මීටර් ගණන , පාට , වර්ගය, දොර දෙකද හතරද, නිෂ්පාදිත වර්ෂය ආදී සියලු විස්තර අවසන

" ආ මට අමතක වුණා.. ඕකෙ නම්බර් එක මොකක්ද? " එහා පැත්තෙන් ඇසේ.
" මේක 13 ශ්‍රී ........."

" ආ අංක ටික එකතු කළා මත් 13 නේද? කලින් කියන්න එපා යැ'
දුරකතනය විසන්ධි වේ.
මෙසේ බොහෝ වරක් වූ පසු
" හෙලෝ "
" අපේ කාරෙක තමයි විකුණන්නෙ. ඒකෙ නොම්මරය 13 ශ්‍රී ....... ඒ අංක ටික එකතු කළාම එන්නෙත් 13 . කාරෙක නම් හොදටම හොදයි. තව විස්තර කියන්නද ?

" නෑ එපා "" දුර කතනය විසන්ධි වේ.
මේක හරි පුදුම රටක් .

මෙච්චර හොද කාරෙක අඩුවටත් දෙද්දි ගන්න කෙනෙක් නෑ. එතකොට 13 ඉපදෙන අය? 13 පන්තියෙ ඉගෙන ගන්න අය ? ඒ අයටත් අපල ද? අපිට සිතෙයි
සති කීපයක් ගත වී යයි 'මහත්මයෙක් පැමිණේ.
ඔහු කාරෙක පරීක්ෂා කරයි.

" හොදටම තියෙනවා . මම එහෙනම් ඇඩ්වාන්ස් එකක් දීලම යන්නම්. "

දැන් ඔහුව ගෙතුලට කැදවීමේ අපේ වාරයය.

" එන්නකො පොඩ්ඩක්. ඇතුළට "' ඔහු වාඩි වූ පසු

" නොම්මරය බැලුවෙ නෑ නේද?"
' නොම්මරය ? "

" ඔව් 13 ශ්‍රී ... සේරම අංක එකතු කළාමත් එන්නෙ 13 "

ඔහු හඬ නගා සිනාසුනේ ය."අපි මුස්ලිම්නෙ. අපේ මිනිස්සු ලග ඔය මනස්ගාත මිත්‍යා මත නැහැනෙ " .

පසු දින පැමිණි ඔහු දුකට සැපට අපට හිටි රතු පාට ඒ වන විට අප නිල් පාට කර තිබූ පුංචි හිතවතා රැගෙන නිල නිවසේ ගේට්ටුවෙන් නොපෙනී යන අයුරු අප බලා සිටියා.

ඒ කාරයෙන් ඔහුට කිසිම කරදරයක් නොවන බව අපට විශ්වාසය .

**ලංකා සිරිවර්ධන**




